**බලංගොඩ ප්‍රාදේශීය සභාව - 2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**-----------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (ඇ) සහ (ඉ) ඡේදවල දක්වා ඇති නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු. 317,303,436 ක් වූ ජ'නල් සටහන් 43 ක් සඳහා ජ'නල් වවුචර් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේ දී ජ'නල් වවුචර් පිළියෙල කිරීම සඳහා කටයුතු කරන බව. | ජ'නල් සටහන් සඳහා ජ'නල් වවුචර් පිළියෙල කළ යුතුය. |
| (ආ) | තක්සේරුගත වටිනාකම රු. 245,000 ක් වූ රූඩ් 03 පර්චස් 20 ක් වූ ඉඩම් 03 ක් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි ශේෂය හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායක වීමේ ගිණුම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු දේපළ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පෙර වර්ෂයේ දී සහ සමාලෝචිත වර්ෂයේ දී මිලදීගත් එකතුව රු. 994,250 ක් වූ හියුම් පයිප්ප තොගය යන්ත්‍ර හා උපකරණ ගිණුම හරහා ප්‍රාග්ධනිත කර තිබීමෙන් යන්ත්‍ර හා උපකරණ ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම හා වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් පමණක් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉතිරි වටිනාකම රු. 1,007,550 ක් වූ හියුම් පයිප්ප තොග ශේෂය හඳුනා නොගැනීම හේතුවෙන් එම වටිනාකමින් තොග ශේෂය අඩුවෙන් හා වර්ෂයේ ප්‍රාග්ධන වියදම වැඩියෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කළ යුතුය. |
| (ඉ) | 2019 හා 2020 වර්ෂ දෙක තුල සභාවේ වත්කම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරන ලද රු. 801,895 ක් ප්‍රාග්ධනිත කර නොතිබීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ද නිවැරදි කර නොතිබුණි. | 2022 අවසාන ගිණුම මඟින් නිවැරදි කරන බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ලැබී තිබුණු රු. 105,000 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම ලැබිය යුතු පොලී | අතපසුවීමකි. ඉදිරියේ දී මෙවන් අතපසුවීම් සිදු නොවීමට වග බලා ගන්නා බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් හිඟහිටි ආදායම් රු. 105,000 කින් වැඩියෙන් දැක්වුණි. | | |
| (උ) | 2021 වාර්ෂික අයවැය තුලින් සභිකයින් සඳහා ප්‍රතිපාදන සලසා දී තිබුණ ද උපයෝජනය නොකළ රු. 990,000 ක් සඳහා ණයහිමි වෙන්කිරීම් සිදුකර තිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා ණයහිමියෝ එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | සභිකයින් හට රු. 30,000 බැගින් වෙන් කළ ව්‍යාපෘති සඳහා පළාත් සභාවෙන් අනුමැතිය 2021 දෙසැම්බර් 31 දින ලැබුණු බැවින් ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි විය. එබැවින් ණයහිමි වශයෙන් මුදල් වෙන් කරන ලදී. එම ව්‍යාපෘති මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කරන බව. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා උපයෝගී ලේඛන අතර එකතුව රු. 34,751,407 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වැරදි හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(5) | 1992 සිට 2013 වර්ෂය දක්වා නිකුත් කරන ලද එකතුව රු. 357,779 ක් වූ පුනරාවර්තන හා ප්‍රාග්ධන අත්තිකාරම් 30 ක් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොමැති වීමෙන් ඒවා කපාහැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර තිබුණි. | රු. 357,779 ක් වන නොපියවූ අත්තිකාරම් සම්බන්ධව පොදු තීරණයක් ගැනීම සඳහා සබරගමුව පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,653,255 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,102,591 ක් විය.

**3.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------------

**පාරිසරික ගැටලු**

--------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුළ මාසිකව ඝණ අපද්‍රව්‍ය ටොන් 30 ක් පමණ ජනනය වුවද ඒවා විධිමත්ව කළමනාකරණය සඳහා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. දිරන අපද්‍රව්‍ය රැස් කිරීම සඳහා සුදුසු භූමියක් පවරාගෙන නොතිබීමෙන් කාබනික පොහොර නිපදවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. එමෙන්ම නොදිරන කසළ සෞඛ්‍යාරක්ෂිතව හා පරිසර හිතකාමීව බැහැර කිරීම සඳහා විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කර නොතිබුණි. | බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නොදිරන කසළ කළමනාකරණය සඳහා 2022 වර්ෂයට මේ වනවිට විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක වෙමින් පවතින අතර දිරන කසළ කළමනාකරණය සඳහා වැලිපතයායේ ඉඩමක් හඳුනාගෙන ඇති අතර එම ඉඩම පවරාගැනීමේ කටයුතු අවසන් මට්ටමේ පවතින බව. | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |